www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# තරුණයින් රැකියාවලින් දොට්ට දමන "ප්‍රථම රැකියා ගිවිසුම"ට එක ම පිලිතුර කම්කරු බලය පිහිටුවීම සඳහා සමාජවාදී මූලෝපායයි

**A socialist strategy for workers' power: the only answer to France's "First Job Contract"**

**ලෝක සමාජවාදී වෙබ් අඩවි කර්තෘ මන්ඩලය විසිනි**

**2006 අප්‍රේල් 04**

*ප්‍රන්සයේ ජනාධිපති චිරැක්ගේ ධනේශ්වර ගෝල්වාදී ආන්ඩුව විසින් තරුන කම්කරුවන් හිතුමතේ දොට්ට දැමීම සඳහා ගෙනෙන ලද "ප්‍රථම රැකියා ගිවිසුම" (සීපීඊ) ට එරෙහි ව අප්‍රේල් 4 දින ප්‍රන්සය පුරා පවත්වන ලද මහජන පෙලපාලිවල දී ලෝක සමාජවාදී වෙබ් අඩවිය සහ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සහායකයන් විසින් බෙදා හරින ලද ප්‍රකාශයේ සිංහල පරිවර්තනය යි මේ.*

*ලෝක කම්කරු පන්ති අරගලයේ තීරනාත්මක අවස්ථාවක් තුල බෙදා හරින ලද මෙම පත්‍රිකාව අධ්‍යයනය කරන මෙන් ද පිටපත් කොට බෙදා හරින මෙන් ද අපි ඉල්ලා සිටිමු. මෙහි ඉංග්‍රීසි හා සිංහල පිටපත් ලෝක සමාජවාදී වෙබ් අඩවිය wsws.org වෙතින් ලබා ගත හැකි ය.*

ගෝල්වාදී ආන්ඩුවේ "ප්‍රථම රැකියා ගිවිසුම" පනතට විරුද්ධ ව දැන් මාසයක් තිස්සේ කෙරී ගෙන යන අරගලය ප්‍රන්සයේ පමනක් නොව මුලු මහත් යුරෝපයේ ද ජාත්‍යන්තරව ම ද කම්කරුවන් සහ තරුන ජනයා මුහුන දී සිටින්නා වූ අතිමූලික පන්ති සහ දේශපාලන ප්‍රශ්න ඉස්මත්තට ගෙනවුත් තිබේ.

මනා වැටුප් සහිත ආරක්ෂිත රැකියා, යහපත් අධ්‍යාපනයක් හා සෞඛ්‍ය සේවයක්, යුද බියෙන් හා මර්දනයෙන් තොර අනාගතයක් යනාදී තරුනයන් හා කම්කරුවන්ගේ අවශ්‍යතාවෝ අසාර්ථක ව පවත්නා දේශපාලන ආර්ථික පද්ධතියක් නියෝජනය කරන ධනේශ්වර මූල්‍ය ප්‍රභූවේ උවමනාකම් සමග සමනය කල නො හැකි ඝට්ටනයකට එලඹී පවතිත්. මෙම ධනයේ හා බලයේ ප්‍රභූ අධිකාරය ධනේශ්වර ක්‍රමයේ අර්බුදය කම්කරු පන්තියේ කරපිටින් යැවීමට අධිෂ්ඨාන කොට ගෙන සිටී.

ආර්ථික 'ප්‍රගතියේ' අනිවාර්ය විපාකවලට ද ගෝලීයකරනයේ යථාර්ථයට ද එරෙහි වූ ලුඩයිට්වරුන් (ධනේශ්වර ක්‍රමයේ මුල් අවධියේ යන්ත්‍ර සූත්‍ර විනාශ කල විරෝධතා ව්‍යාපාරයක්) ය යි, ප්‍රන්ස කම්කරුවන්ට හා තරුනයන්ට මඩ ගැසීමට දරන්නා වූ සියලු ප්‍රයත්නයන්හි සැබෑ අන්තර්ගතය එය යි.

ඇත්ත වසයෙන් ම කම්කරු පන්තියේ ඉතා මූලික අවශ්‍යතාවන්ට එරෙහිව ධනේශ්වර පාලක පන්තිය විසින් එල්ල කොට ඇති ප්‍රහාරයට යටින් පවත්නා හේතුව වනාහි ලාභ පොදි සහ ධනපතියන්ගේ පෞද්ගලික ධනය තර කර ගැනීම සඳහා සමාජ අවශ්‍යතා පාගා දැමීම මිස ආර්ථික ජීවිතය භූගෝල පරිමානව ඒකාග්‍ර කිරීම නො වේ.

හේතු දැක්වීමකින් තොර ව තරුන කම්කරුවන් දොට්ට දැමීමට හාම්පුතුන්ට මග පාදන "ප්‍රථම රැකියා ගිවිසුම" (සීපීඊ) අත්සන් කිරීම මගින් ජනාධිපති චිරැක් වැඩට බැසගෙන ඇත්තේ ප්‍රන්සයේ පමනක් නො ව ජාත්‍යන්තරව ම ද පාලක පන්තිය වෙනුවෙනි. උදාහරනයක් දැක්වුව හොත්, ජර්මනියේ ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍ර-සමාජ ප්‍රජාතන්ත්‍ර ආන්ඩුව ද මෙයට මුලුමනින් ම සමාන පනතක් සූදානම් කරමින් සිටින බව පසු ගිය සතියේ ඉස්මත්තට පැමිනියේ ය.

මහජන විරෝධතාවන් ද වැඩ වර්ජන ද ප්‍රන්ස ජනතාවගේ අතිමහත් වැඩි කොටසකගේ විරුද්ධත්වය පෙන්නුම් කරන ජනමත විචාරන ද ඉදිරියේ ජනාධිපති චිරැක් මෙම පනතට අත්සන් කිරීම පන්ති සම්බන්ධතාවයන්ගේ පරිවර්තනීය මංසන්ධියක් සලකුනු කරයි. යුරෝපීය ධනේශ්වර පන්තිය තමන්ගේ ඇමරිකානු සගයන් ගෙන ඇති පියවර අනුව යමින් සැරසී ගෙන සිටින්නේ ශතවර්ෂයක අරගලයක් තුලින් ප්‍රන්ස කම්කරු පන්තිය දිනා ගෙන ඇත්තා වූ සකල

ප්‍රතිලාභයක් ම සුනු විසුනු කර දැමීමට ය. ප්‍රන්ස ධනපති පන්තිය මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂය විසින් පමනක් වැලැක්වෙනු නැත.

තමා මෙම පනතට අත්සන් කිරීමට ගත් තීන්දුව ප්‍රජාතන්ත්‍ර ක්‍රියාදාමයක් තහවුරු කිරීමක් ය යි පින්තාරු කර දැක්වීමට චිරැක් තම රූපවාහිනී දේශනයේ දී කුටප්‍රාප්ත නරුම බවකින් යෙදී ගත්තේ ය. විවාදයකට ඉඩ නො තබා පාර්ලිමේන්තුව මැද්දෙන් ලහිලහියේ ම තල්ලු කර ගැනුනු හාම්පුතුන්ගේ සම්මේලනය තරයේ ඉල්ලා සිටි එසේ ම ජනතාවගේ අතිමහත් වැඩි කොටසකගේ බලගතු විරෝධයට ලක් වූ නීතියක් ප්‍රජාතන්ත්‍රවාදයේ සඳේහතාවය යයි ප්‍රකාශ කරනු ලැබ ඇත!

සීපීඊ පනතට එරෙහි මහජන ව්‍යාපාරය විසින් එලිදරව් කරනු ලැබ ඇත්තේ ආන්ඩුව පස්සට තල්ලු කිරීමේ ඉලක්කය පදනම් කර ගත් කුමන ඉදිරි දර්ශනයක හෝ සාවද්‍යභාවය යි; මගහැරිය නො හැකි ලෙස ඉස්මතු වී ඇත්තේ ධනේශ්වර ආන්ඩුව පෙරලා දමා ඒ වෙනුවට කම්කරු පන්තිය විසින් සැබැවින් ම පාලනය කරනු ලැබුවා වූ ද කම්කරු පන්තියේ උවමනාකම් ආරක්ෂා කරන්නා වූ ද ක්‍රියාමාර්ගයකට කැප වී ගත් ආන්ඩුවක් බලයට පත් කිරීමේ අවශ්‍යතාවය යි.

මේ සියල්ලට ම යටින් පවත්නා වූ තීරනාත්මක ප්‍රශ්නය වන කම්කරු පන්තිය බලය අල්ලා ගෙන සමාජය සමාජවාදී ලෙස ප්‍රතිසංවිධානය කිරීම එන්න එන්න ම වඩාත් සෘජුව ඉස්මතු වෙමින් පවතී.

නිල ''වාමාංශික පක්ෂ'' සමාජවාදී පක්ෂය සහ කොමියුනිස්ට් පක්ෂය යලිත් ආන්ඩු බලයට පත් කිරීම මගින් කම්කරු පන්තියට සහ තරුනයන්ට විරුද්ධ මෙම ප්‍රහාර නවත්වනු නැත.

1995 මහා ස්ට්‍රයික් ව්‍යාපාරයෙන් ඉක්බිති බලයට පත් කරනු ලැබූ එවකට සමාජවාදී පක්ෂ නායකයා ව සිටි ලයනල් ජොස්පින්ගේ බහු-වාම ආන්ඩුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ කප්පාදු ප්‍රතිපත්ති සහ සමාජ සේවා විනාශ කිරීම මගින් එක් දෙයක් ඔප්පු කරනු ලැබී ය. එනම්, තවත් සමාජවාදී පක්ෂ-කොමියුනිස්ට් පක්ෂ ආන්ඩුවක් අගමැති ඩොමිනික් විලේපින් සහ ජනාධිපති චිරැක්ගේ පිලිවෙත්වලට කිසියම් මැ හෝ අර්ථභාරී ආකාරයකින් වෙනස් වනු නැති බව ය.

අරගලයේ වර්ධනය විසින් තීව්‍ර ලෙස ඉස්මතු කර ඇත්තේ පැරනි නිලධාරි තන්ත්‍රීය සංවිධානයන්ගෙන් - වෘත්තීය සමිති සහ සමාජවාදී පක්ෂයෙන් හා කොමියුනිස්ට් පක්ෂයෙන් - මුලුමනින් ම ස්වාධීන වූ නව විප්ලවවාදී නායකත්වයක් කම්කරු පන්තිය තුල ගොඩ නැගිය යුතු ව ඇති බව ය. ඉහත සඳහන් සංවිධාන යලිත් වරක් ඉටු කරන්නේ 1930 ගනන්, 1968 සහ 1995 දී ඔවුන් ක්‍රියාත්මක කල ක්‍රියාකලාපය ම ය. ඔවුහු, සීපීඊ පනතට සහ ගෝල්වාදී පාලනයට විරුද්ධ අරගලයේ මූලිකත්වය ගන්නවා වෙනුවට කම්කරු පන්ති ව්‍යාපාරය සිර කොට රඳවා පාලක පන්තියේ ඒ හෝ මේ කොටස පසුපස ගාල්කොට පරාජය කරා මෙහෙයවති.

වෘත්තීය සමිති හෝ නිල ''වාම'' පක්ෂ චිරැක්ගේ තීන්දුවට ඉක්බිත්තේ ඔහුගේ ආන්ඩුව පෙරලා දැමීමට කැඳවුම් නො කරති. සටන් දිනය ලෙස නම් කර ඇති අප්‍රේල් 4 වන දින දී ඔවුන් එවන් කැඳවුමක් කර නැත. ඒ වෙනුවට ඔවුන් විසින් කර ඇත්තේ පසුගිය ඉරිදා ජාතික ශිෂ්‍ය සම්බන්ධීකාරී කමිටුව විසින් අසීමිත මහා වැඩ වර්ජනයක් සඳහා කර්මාන්ත ශාලා හා කාර්යාල තුල කම්කරුවන්ට සෘජු ව කර ඇති ඉල්ලීම නො තකා හැරීම ය, මාර්තු 28 වන දා බලමුලු ගැන්වීමේ දී මෙන් ම යලිත් වරක් වෘත්තීය සමිති සිතාමතා ම ස්ට්‍රයික් ක්‍රියාව සීමා කර පොදු ප්‍රවාහන සේවය පවත්වා ගෙන යාමට හැකි තත්වයක් ඇති කිරීමට ද ඔවුහු කටයුතු කරති.

මහාජන විරෝධතාවය මගින් තමාගේ ආන්ඩුවේ ද සමස්ත දේශපාලන සංස්ථාපිතයේ ද දුබලතාවය සහ හුදෙකලා භාවය එලිකර ඇති බව චිරැක් මැනවින් දැන සිටී. සීපීඊ පනතේ කොන්දේසි පිලිබඳව ''ලිහිලක්'' ලබා දීමට ඔහු යෝජනා කර සිටින්නේ ඒ නිසා ය. වෘත්තීය සමිති සමග සාකච්ඡා කිරීමට ඔහු කැඳවුම් කර සිටින්නේ ද මේ නිසා ය. ඔහුගේ උපාමාරුවේ අන්තර්ගතය වන්නේ වෘත්තීය සමිති ද නිල වාමාංශික පක්ෂ ද උන්ගේ ''ඈත වමේ'' ආධාරකරුවන් වන ''ලීග් කොමියුනිස්ට් රෙවලූෂනය'' (එල්සීආර්) සහ ලුට් උඉයේ (එල්ඕ) යන සංවිධාන ද මහජන විරෝධය සිරකොට, දිරිය බිඳ, දියකර හැරීම සඳහා වඩාත් සෘජුව යොදා ගැනීම ය.

2002 ජනාධිපතිවරනයේ චිරැක් යලිත් වරක් තෝරා ගැනීමට ද ඔහුගේ 'ජනප්‍රිය බහුතරයක් සඳහා ව්‍යාපාරය' (යූඇම්පී) ට ජාතික මන්ත්‍රී මන්ඩලයේ බහුතරයක් දිනා ගැනීමට ද මෙම පක්ෂ තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කලාහ. ප්‍රථම රවුමේ දී ජොස්පින් නව ෆැසිස්ට්වාදී ජාතික පෙරමුනු අපේක්ෂක ජීන් මාරි ලෙපෙන් අතින් පරාජය වූ පසු මෙම වම්මු දක්ෂිනාංශික දේශපාලක චිරැක් ''සමූහාන්ඩුවේ'' ගැලවුම්කරු යයි පින්තාරු කරමින් ඔහුට ඡන්දය දෙන ලෙස කියා සිටියා හ. ඔහුගේ ප්‍රතිගාමී පිලිවෙත්වලට වගකීමෙන් පංගුවක් ඔවුන්ට ද පැවරේ.

නිල ''වාමාංශික'' පක්ෂවල ද වෘත්තීය සමිතිවල ද බියගුලුකමේ සහ දනින් වැටීමේ තර්කනය කෙතරම් දැයි කිවහොත්, දැන් ඔවුහු ගෝල්වාදී යූඇම්පීයේ අතිශයින් ම දක්ෂිනාංශික කොටසේ නියෝජිතයා වන නිකොලොස් සර්කෝසිට දේශපාලන

විශ්වසනීයත්වයක් ලබා දීමට කටයුතු කරන තැනට පත්ව සිටිති. යූඇම්පී යේ සභාපති වූ ද අභ්‍යන්තර ආරක්ෂක ඇමති වූ ද සර්කෝසි ලබන අවුරුද්දේ ජනාධිපතිවරනයේ දී විලේපින්ට එරෙහිව ඉදිරිපත් කිරීමට සැලසුම් කරමින් සිටී. ජනතා විරෝධයට පාත්‍ර වූ සීපීඊ පනතට සහාය පලකරන ගමන් ම ඔහු උත්සාහ කරමින් සිටින්නේ වෘත්තීය සමිති සමග සාකච්ඡා කිරීමට අසමත් වීම ගැන විලේපින් ව විවේචනය කරමින් ඔහුට එරෙහිව ඇති මහජන විරෝධය ගසාකෑමට ය. ලපෙන්ගේ කඳවුරේ සිටිනා වර්ගවාදීන් හා ෆැසිස්ට්වාදීන්ගේ සහාය පතන සර්කෝසි විදේශ ආගාමික තරුනයින් හෙලා දකිමින් පෙලපාලිකරුවන්ට එරෙහි පොලිස් ප්‍රකෝපකරනය හා ප්‍රචන්ඩත්වය මෙහෙයවමින් සිටියි. දැනට ම 2000 ක් දෙනා අත් අඩංගුවට ගනු ලැබ ඇත. චිරැක්ගේ කතාවට පසු සර්කෝසි වෘත්තීය සමිති හා ශිෂ්‍ය සම්මේලන සමග සාකච්ඡා යෝජනා කරමින් ආරම්භකත්වයක් ගෙන සිටී. ඔහු ඉරිදා ප්‍රන්ස කම්කරු ප්‍රජාතන්ත්‍ර සම්මේලනයේ සමාජවාදී පක්ෂයට සම්බන්ධ වූ (සීඑෆ්ඩීටී) ප්‍රැන්කෝ ෂරේක් සහ යූඑන්ඊඑෆ් ශිෂ්‍ය සංවිධානයේ සභාපති බෲනෝ ජුලියාඩ් යන දෙදෙනා සාකච්ඡා සඳහා කැඳවී ය. සර්කෝසි සමග සාකච්ඡා කිරීමට ඔවුහු එකඟ වූහ.

මෙම සිදුවීම් අවධාරනය කරන්නේ ව්‍යාපාරය මුහුන දී සිටිනා දේශපාලන කර්තව්‍යයන් විසඳලීම සඳහා හුදෙක් සටන්කාමීත්වය නො සෑහෙන බව ය. විප්ලවවාදී සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගයක් මත නව පක්ෂයක් ගොඩනැගීම මගහැර ගෙන පෙරට යා නො හැකි ය.

ක්‍රියාමාර්ගයේ හරිමැද පවතින්නේ කම්කරු පන්තියේ ජාත්‍යන්තර එක්සත් භාවය ය. ධනේශ්වර භූගෝලීකරන යුගයේ දී සීපීඊ පනත හා බැඳී පැන නැගී ඇති ප්‍රශ්න කිසිවක් ප්‍රන්ස ජාතික රාජ්‍යය තුල විසඳලිය නො හැකි ය. 1960 ගනන්වල සහ 70 ගනන්වල සමාජ ප්‍රතිසංස්කරන පිලිවෙත් කරා ආපසු ගමන් කල හැක්කේ ද නැත.

අද ප්‍රන්සයේ ද ලෝකය පුරා ම ද කම්කරු පන්තිය මුහුන දී සිටින්නේ නිරන්තර ව රැකියා කප්පාදු කරමින් දියුනු කාර්මික රටවල සිට වඩාත් ලාභ ශ්‍රමය පවතින දිළිඳු රටවලට රැකියා මාරු කර යවන්නා වූ ජාත්‍යන්තර සංගතවලට ය.

කම්කරුවන්ගේ අයිතිවාසිකම් සහ ජීවන තත්වයන්ට එරෙහි ගෝලීය ප්‍රහාරයන් පරාජය කිරීමේ අරගලය සඳහා සමාජවාදී ඉදිරි දර්ශනයක් මත පදනම් වූ කම්කරු පන්තියේ ජාත්‍යන්තර මහාජන ව්‍යාපාරයක් ගොඩනගා ගැනීම අවශ්‍ය ව ඇත. එවන් ව්‍යාපාරයක් සියලු ම ජාතීන්, වර්ගයන් සහ ආගම්වල කම්කරුවන් ඒකාබද්ධ කර ගත යුතු ය; කම්කරුවන්ට තමන් කැමති ඕනෑ ම රටක සම්පූර්න සහ සමාන නීතිමය අයිතිවාසිකම් සහිත ව ජීවත් වීමේ ද වැඩ කිරීමේ ද අයිතිය ආරක්ෂා කල යුතු ය.

කම්කරු පන්තිය අප්‍රතිහත ව ප්‍රජාතනත්‍ර අයිතීන් සහ සමාජ අයිතීන් ආරක්ෂා කල යුතු ය. අධිරාජ්‍යවාදී යුද්ධයට විරුද්ධ විය යුතු ය. ඉරාකයෙන් සහ ඇෆ්ඝනිස්ථානයෙන් සියලු විදේශීය හමුදා ඉවත් කල යුතු යයි කියා සිටිය යුතු ය.

තවදුරටත් මහා සංගතවල ලාභ ද පෞද්ගලික ධනය ද ගොඩගසා ගැනීමට යටත් නො කොට දිලිඳුකම අහෝසි කිරීම සඳහා ද සියලුදෙනාට යහපත් ජීවන තත්වයක් සම්පාදනය කිරීම සඳහා ද ආර්ථික ජීවිතය ජාත්‍යන්තර සහ තර්කානුකූල පදනමක සංවිධානය කල යුතු ය.

යුරෝපයේ කම්කරු පන්තිය යුරෝපීය සංගමයේ ධනේශ්වර පිලිවෙත්වලට ප්‍රතිවිරුද්ධ කම්කරු පන්තියේ ක්‍රියා මාර්ගය වනඃ යුරෝපා එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා එක්සත්ව සටන් වැදිය යුතු ය.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වනාහි කම්කරු පන්තිය තුල එවන් ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීමේ කේන්ද්‍රීය මාධ්‍යය යි. වසර ගනනාවක් තිස්සේ මාක්ස්වාදය ද ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ උරුමය ද ආරක්ෂා කලා වූ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ අන්තර්ජාල ප්‍රකාශනය *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* යි. අපි සියලු ම තරුන ජනයාගෙන් ද කම්කරුවන්ගෙන් ද *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කියවා ප්‍රන්සය ද යුරෝපය ද පුරා ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවන් ගොඩනැගීමට ඉදිරිපත් වන ලෙස ඉල්ලා සිටිමු.

© www.wsws.org